ජාත්‍යන්තරයට එම නිර්මාණ හඳුන්වා දීම සහ එම ක්ෂේත්‍රයන්හි නියුතු සියලු කලා ශිල්පීන්ගේ අධ්‍යාපන, සාමාජයික හා ආර්ථික තත්ත්වයන් නඟා සිටුවීම ;

(ආ) ශ්‍රී ලංකාවේ ළමා හා කාන්තා අභිවෘද්ධිය, සාමාජයීය, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් ඔස්සේ ඇතිකරලීම ;

(ඇ) ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සකලවිධ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ;

(ඈ) උසස් අධ්‍යාපන ආයතන ශක්තිමක් කිරීම, උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හා ශිෂ්‍යත්ව සඳහා අනුබල දීම ;

(ඉ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය සඳහා සහායවීම හා තොරතුරු තාක්ෂණය සංවර්ධනය හා ව්‍යාප්ත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටුවීම;

(ඊ) ඉහළම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් කෘෂිකාර්මික, වැවිලි හා ධීවර අංශ වැඩිදියුණු කිරීම;

(උ) ග්‍රාමීය හා නොදියුණු ප්‍රදේශ ඒවායේ ඇති ස්වාභාවික සම්පත් උපයෝගී කර ගනිමින් පවත්වාගෙන යා හැකි දියුණුවක් ඇති කිරීම ;

(ඌ) නිවාස හා ඉඩම් අහිමි පවුල් සඳහා නිවාස හා ඉඩම් සැපයීම, අඩු පහසුකම් සහිත පාසල් සඳහා ගොඩනැගිලි සැපයීම හා සෙසු අවශ්‍යතා සැපයීම සහ විවිධ ප්‍රදේශවලට මහාමාර්ග, විදුලිය හා සෞඛ්‍ය පහසුකම් වැනි යටිතල පහසුකම් සැපයීම ;

(එ) මානුෂික, ක්‍රීඩා, සාහිත්‍ය, සෞන්දර්ය හා ආධ්‍යාත්මික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම හා උනන්දු කරවීම;

(ඒ) ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් හා ජාතීන් එකමුතු හා ශක්තිමත් කිරීම සඳහා සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම් උනන්දු කරවීම;

(ඔ) මිනිස් අයිතිවාසිකම්, මිනිස් සාරධර්ම, මූලික නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම;

